# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2204/12 - 2020 දෙසැම්බර් මස 01 වැනි අඟහරුවාදා - 2020.12.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ නුවරඑළිය මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන නුවරඑළිය මහ නගර සභාවේ තෝරාඑවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වන වගන්තිය යටතේ නුවරඑළිය මහ නගර සභාවේ තෝරාඑවා ඇති සභිකයෙකු ලෙස පත් වූ කෝජාමුඩලියර් අබ්දුල් වාහිඩ් මොහොමඩ් ෆලීල් අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම නුවරඑළිය මහ නගර සභාවේ තෝරාඑවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා දෙඩම්පෙ ගමගේ මහින්ද කුමාර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

නුවරඑළිය මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී, පුලස්ති සේරසිංහ පතිරණ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වන වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින්, දෙඩම්පෙ ගමගේ මහින්ද කුමාර, නුවරඑළිය මහ නගර සභාවේ තෝරාඑවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**පුලස්ති සේරසිංහ පතිරණ,**
තේරීම්භාර නිලධාරී,
නුවරඑළිය මහ නගර සභාව.

2020 නොවැම්බර් මස 30 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
නුවරඑළිය.

12 - 269

1A - G 33297 — 30 (2020/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*